ආර්ථික වර්ධන සිහිනය

වර්තමාන දේශපාලන අර්බුදය සහ ඒ හේතුවෙන් දේශපාලන ක්‍රියාවලිය ඇණ හිට තිබීම, ජාතීන් අතර තිබෙන අර්බුදකාරී තත්ත්වය සහ දේශපාලන පරිසරය ආර්ථිකයට සිදු කර ඇති බලපෑම් අති මහත්ය. පාස්කු ඉරිදා එල්ල වූ මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරවලින් පසුව ආර්ථිකය සාමාන්‍ය තත්ත්වයට ගෙන ඒමට දැරූ ප්‍රයත්න ද සාර්ථක වූයේ නැත. ඒ අතර අහිතකර බලපෑම් ඉස්මතු කොට, ප්‍රහාර සිදු වීමට පෙර පවා ආර්ථිකය මන්දගාමී තත්ත්වයක පැවතුණි. පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරවලින් සිදු වුණු විශාල හානිය ආර්ථිකයට සිදුව තිබේ.

ආරක්ෂාව සහතික කිරීම සහ ආරක්ෂක තත්ත්වය සහතික කිරීමෙන් බෝම්බ ප්‍රහාරවලින් ආර්ථිකයේ සිදු වූ පසුබෑම මග හරවා ගත හැකිය. කෙසේ නමුත් වාර්ගික ප්‍රචණ්ඩත්වය, ජාතීන් අතර තිබෙන නොසන්සුන්තාව සහ දේශපාලන විෂමතා නිසා ආර්ථිකයට සිදුවන සෘණාත්මක බලපෑම් දරුණුය.

පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාර එල්ල වී මාස දෙකක් ගෙවී ගොස් තිබියදී මේ මොහොතේ ජාතීන් අතර තිබෙන නොසන්සුන්තාව සහ දේශපාලන ක්‍රියාවලිය ඇණ හිට තිබීම නිසා ආර්ථිකය පසුබෑමට ලක් වී ඇත. දේශපාලන ක්‍රියාවලිය ඇණ හිටීමට ප්‍රධාන හේතුව ජනාධිපතිවරයාත් අගමැතිවරයාත් අතර තිබෙන අර්බුදයයි. එය අවිනිශ්චිත අතර විශ්ව ප්‍රතිඵලයක් ලෙස දේශපාලන ස්ථාවර තත්ත්වයක් නිර්මාණය වී තිබේ. ජනාධිපතිවරයාත් අගමැතිවරයාත් අතර මේ වනවිට නිර්මාණය වී තිබෙන අර්බුදය පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරවලින් සිදු වූවාට වඩා හානියක් ආර්ථිකයට සිදු කරමින් තිබේ.

බෝම්බ ප්‍රහාරවලින් සිදු වූ බලපෑම

පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරවලින් වැඩිම බලපෑමක් සිදුවූයේ සංචාරක කර්මාන්තයටය. සංචාරක කර්මාන්තයෙන් මෙන්ම ඊට සම්බන්ධ අනෙකුත් ක්‍රියාකාරකම්වලින් ලැබෙන ආදායම් ද අඩුවිය. විදේශ ආයෝජන පසුබෑමට ලක්වූ අතර බෝම්බ ප්‍රහාරවලින් පසුව ආර්ථිකය වර්ධනය වන වේගයට බාධා එල්ල විය. එමගින් නොව ආර්ථිකය මන්දගාමී විය.

සංචාරක කර්මාන්තය

පසුගිය වසරේදී සංචාරක කර්මාන්තයෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන 4ක ආදායමක් ලැබුණු අතර මේ වසරේදී ඩොලර් බිලියන 5ක ආදායමක් ඉපයිය හැකි යැයි ඇස්තමේන්තු කර තිබිණි. එහෙත් පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසුව එම ඇස්තමේන්තුව ඇමෙරිකානු ඩොලර් බිලියන 3.5ක් දක්වා පහත වැටිණි. සාමය ස්ථාපිත වීමත් ආරක්ෂාව තහවුරු වීමත් සමග මේ වසර අවසන් වන විට සංචාරක කර්මාන්තය සහජ යථා තත්ත්වයට පත්වනු ඇතැයි බලාපොරොත්තු විණි. එහෙත් දැන් උද්ගත වී තිබෙන තත්ත්වයත් සමග එසේ සිදුවනු ඇත්ද යන්න ප්‍රශ්නයකි.

සංචාරක සහ සත්කාර කර්මාන්තයට සිසිකෙක් සුදුසු නැති වර්තමාන තත්ත්වය යටතේ සංචාරක කර්මාන්තයෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන 3.5ක ඉලක්කය හෝ සපුරා ගැනීමට හැකිවනු ඇත්ද යන්න ගැටලුවකි. විශේෂයෙන්ම පවතින දේශපාලන අස්ථාවරත්වය සහ ජාතීන් අතර තිබෙන නොසන්සුන්තාව මධ්‍යයේ එම ආදායම් උපයා ගැනීම දුෂ්කර වනුයේ බවට පත්ව තිබේ.

බෝම්බ ප්‍රහාර නිසා දේශපාලන විෂමතා සහ ජාතීන් අතර තිබෙන අර්බුදකාරී තත්ත්වය නිසා රට ලැබෙන විදේශ ආයෝජන ද අඩුවිනු ඇත. ඉන්දියාව, බංග්ලාදේශය, වියට්නාමය සහ මැලේසියාව හිස්විය ප්‍රතිපත්ති ඇති රටවල් හා සසඳීමේදී දේශපාලන අස්ථාවරත්වය නිසා ශ්‍රී ලංකාව විදේශ ආයෝජනවලට අවම ආකර්ෂණයක් ඇති රටක් බවට පත්ව තිබේ.

යථා තත්ත්වයට පත්වීම

ආරක්ෂාව තහවුරු කිරීමෙන් පසු ආර්ථිකය යථා තත්ත්වයට පත්වනු ඇතැයි අපේක්ෂා කළා තිබිණි. ආරක්ෂාව තහවුරු කළ නමුදු ජාතීන් අතර ඇති වූ සංවිධානාත්මක සහ සුදානම් ඇති ව නොරුණු ප්‍රචණ්ඩ ක්‍රියා නිසා ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීමේ ක්‍රියාවලිය දුෂ්කර කරන ලදී.

දේශපාලන ඇණහිටීම

දේශපාලන අවහිරය නිසා රටේ කටයුතු ඇණ හිටීම තවත් සැලකිය යුතු කරුණකි. වර්තමාන දේශපාලන අවුල්සහගත ඉක්මනින් විසඳෙනු ඇතැයි ඉතා සුළු බලාපොරොත්තුවක් තිබේ. මෙරට දේශපාලනයේ මේ වනවිට තිබෙන අවුල් වියවුල් තත්ත්වය නිසා

ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම නවතී තිබෙන අතර, ව්‍යාපාරික විශ්වාසය පිරිහී ගොස් තිබේ. විදේශ ආයෝජන ලැබීම්වලට බාධා එල්ල වී තිබෙන අතර ආර්ථිකය සහජ යථා තත්ත්වයට පත් කිරීමේ ක්‍රියාවලිය ප්‍රමාද කර තිබේ.

ජාතිභේදවාදය/වාර්ගික වාදය

ආගමික සහ වාර්ගික ජාතිභේදවාදය නැවත මතුවීම සඳහා දායකත්ව ආර්ථික වර්ධනයට දරුණු ප්‍රතිවිපාක ගෙනෙනු ඇත. නිදහසින් පසු රටේ ආර්ථික සංවර්ධනයට වැඩි වශයෙන් බලපෑම් එල්ල කරන ලද සාධකය වූයේ ද මෙම වාර්ගික ගැටුම් සහ ජාතීන් අතර පවතින නොසන්සුන්තාවය යි.

දේශපාලන වටපිටාව

වර්තමාන දේශපාලන පරිසරය ආර්ථිකයට හිතකර නොවේ. දේශපාලනඥයන් ආර්ථිකය කෙරෙහි කිසිදු සැලකිල්ලක් නොදක්වන අතර සිවිල් සංවිධාන බලය අල්ලා ගැනීමට පොරකති. ආර්ථික සංවර්ධනය ගුණ ප්‍රධානයට ගැනී කර දමා ඇත.

ආචාර්ය
නිමල් සඳරත්න
ලියයි

දේශපාලන අවහිරය

ජාතීන් අතර තිබෙන නොසන්සුන්තාව සහ නමුත් ගැටුම් ඇති වන/සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියා ආර්ථිකයට හිතකර නොවේ. වර්තමාන දේශපාලන අවහිරය නිසා ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීමටත් ආර්ථිකය සංවර්ධනයට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමත් හැකියාව නැත. දේශපාලන පරිසරය ක්ෂණික වූවත් එය ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීමට උපකාරී සහ හිතකර පරිසරයක් විය යුතුය. එසේ නොවුණහොත් රටේ ආර්ථික වසාපිය තවත් උග්‍ර විනු ඇත.

විදෙස් ආයෝජන

ප්‍රායෝගික නොවන ප්‍රතිපත්ති හේතුවෙන් විදෙස් ආයෝජන සම්බන්ධයෙන් රටේ ජනතාව තුළ ඇත්තේ වැරැදි අදහස්ය. රටේ සංවර්ධනයට විදෙස් ආයෝජන බව සෑම පක්ෂයක්ම පිළිගන්නා කරුණකි. එහෙත් රටට විශාල ආයෝජනයක් පැමිණි පසු ඊට එල්ල වන විරෝධය ප්‍රචණ්ඩ වූ නොවේ. හම්බන්තොට වරාය, හම්බන්තොට කර්මාන්ත පුරය ද කොළඹ වරාය නගරය ද වෙනත් යම් දු වූවද ඊට එල්ල වන විරෝධය අසීමිතය. එමෙන්ම රටේ සම්පත් විදේශිකයන්ට විකුණන්නේ යැයි ද චෝදනා සහ විරෝධතා එල්ල වේ.

කොළඹ වරාය පර්යන්තය

එසේ විදෙස් ආයෝජනවලට විරෝධතා එල්ල වීම අලුත්ම සිදුවීම කොළඹ වරායේ නැගෙනහිර බහාලුම් පර්යන්තය සම්බන්ධයෙන් ඇති වී තිබෙන අර්බුදයයි. මෙම පර්යන්තය සංවර්ධනය කිරීමෙන් රටට විශාල ප්‍රතිලාභ රැසක් ලැබිය හැකිය. විදෙස් සහයෝගය මැද අනෙක් පර්යන්ත දෙක සංවර්ධනය කිරීමෙන්ද එසේ ප්‍රතිලාභ ලැබීමට හැකියාව ලැබිණි.

මෙම පර්යන්තය සංවර්ධනය කිරීම සඳහා සහ ඊට සහාය දීමට ඉන්දියාව සූදානමින් සිටි. ඉන්දීය වරායවල බහාලුම් නැවත නැව් ගත කෙරෙන්නේ මෙම පර්යන්තයෙන් නිසා ඉන්දියාව මීට සම්බන්ධ වීම ඉතා වැදගත්ය. එමෙන්ම ජපානයේ ඉන්දියාව ඉන්දියාවේ ජපානයේ මූල්‍ය ආධාර ලැබීමද සහතිකවන තත්ත්වයකි.

බොරු විරෝධතා

මෙම පර්යන්තය ඉන්දියාවට විකුණා දමන බවට විරෝධතාවක් එල්ල වී තිබේ. මේ පර්යන්තයේ පාලනය අයිතිය ඇත්තේ ශ්‍රී ලංකා වරාය අධිකාරියටය.

ඉන්දීය අගමැති නරේන්ද්‍ර මෝදි පසුගිය දා ශ්‍රී ලංකාවේ සංචාරය කිරීම නිසා ඊට නවත් ප්‍රසිද්ධියක් ලැබිණි. විදෙස් ආයෝජනවලට විරුද්ධ වීම මෙම ප්‍රවණතාව ආර්ථික වර්ධනයට බාධා එල්ල කරයි. අසල්වැසි ආසියාවේ සහ නිරිතදිග ආසියාවේ රටවල් හා සසඳීමේදී එය ඉතා සාහසිකවූ තත්ත්වයකි. එම රටවල් සියල්ලේ ආර්ථික පෙරළියට ලෙස ඉහළ ආර්ථික වර්ධනයක් අත්පත් කරගත්තේ විශේෂයෙන්ම සෘජු විදෙස් ආයෝජනවලිනි.

නිගමනය

නිදහසින් පසු රටේ ආර්ථික සංවර්ධනයට එල්ල වූ ප්‍රධාන බාධාව වාර්ගික ප්‍රචණ්ඩත්වයයි. එවැනි ප්‍රචණ්ඩ ක්‍රියාවලින් ඉක්මනින් නොවිනාශ හා මිය නැගීමට සිදුවන හානිය මෙන්ම දිගුකාලීනව ආර්ථිකයට සිදුවන බලපෑම ද සුළුපටු නොවේ. එමනිසා නොවේ එවැනි ප්‍රචණ්ඩ ක්‍රියා නිසා ආර්ථික කඩාකප්පල්ය ද පහළ වැටෙන අතර දිගුකාලීනව ආර්ථික ධාරිතාව ද දුර්වල කරනු ඇත.

රටේ පවතින ආර්ථික හා සංස්කෘතික වටපිටාව ද ආර්ථික සංවර්ධනයට බාධා එල්ල කරන බව දැන් ඉතා හොඳින් පැහැදිලිව පෙනෙන්නට තිබේ. එම සාධකවලට අමතරව රටේ ආයතනික සත්කාරය සහ රටේ තත්ත්වය ආර්ථිකයට හිතකර තත්ත්වයක් බවට පත්කරනු වෙනුවට ඉතා හිතකර ලෙස කරගෙන හා සාධක රටේ ආර්ථිකය අංශභාග තත්ත්වයකට පත්කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස රටේ දිගුකාලීන වාර්ෂික සාමාන්‍ය ආර්ථික වර්ධන වේගය සියයට 3.5ක් දක්වා පහළ වැටී තිබේ.

රටේ දේශපාලන සංස්කෘතිය, සංස්කෘතික වටපිටාව, දේශපාලනය ආගමෙහිමය සහ සැබෑම වේගවත් ආර්ථික වර්ධනයට හිතකර නොවේ. ඒ සියල්ලේ ප්‍රතිඵලය වෙනස්කම් නොකළහොත් වේගවත් ආර්ථික සංවර්ධනයක් අත්පත් කරගැනීම පළ නොහැක්කකි.

මුදල් රාජ්‍ය අමාත්‍ය ඉරාන් වික්‍රමරත්න මහතා කළ ප්‍රකාශයක් ද මෙහිදී උපුටා දැක්විය යුතුය. "ආයෝජකයකු ඉදිරියට යන්නේ ද නැද්ද යන්න සම්බන්ධයෙන් තිබෙන විශාලතම අවිනිශ්චිතතාව ආර්ථික ක්‍රියාකාරකම් නොව දේශපාලන ක්‍රියාකාරකම් ය. එමෙන්ම ඉදිරි මාස කිහිපයේදී සිදුවන හා සිදුවිය හැකි දේවල් ය."

වර්තමාන දේශපාලන හා ආර්ථිකය වටපිටාව දෙස බැලීමේදී වේගවත් ආර්ථික සංවර්ධනයක් පළ සිහිනයක් පමණි.

සන්ඩේ ටයිම්ස් පුවත්පතේ පළවූ ලිපිය සිංහලට පරිවර්තනය කළේ
හර්ෂණ තුෂාර සිල්වා